# කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරු දරණ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය

## 1. හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009/02/20 දිනැති අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද කාර්ය පරිපාටික රීති I වැනි කාණ්ඩයේ XVIII පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ගත තනතුරු සඳහා වන ස්ථාන මාරු පටිපාටිය.

### 1.1 ස්ථාන මාරු සිදු කරන ආකාරය

ස්ථානමාරු අපේක්ෂා කරන නිලධරයන්ගේ ඉල්ලීම් ඉටුකිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටු ලබාදෙන නිර්දේශ අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ක්‍රියාත්මක කෙරේ. මෙම මාරුවීම් වර්ෂයේ ආරම්භක වැඩ කරන දිනයේ සිට ක්‍රියාත්මක වේ.

## 2. වාර්ෂික ස්ථානමාරු සඳහා යටත් වන නිලධරයන්

2.1 මේවන විට සේවයේ යෙදී සිටින පහත තනතුරු දරණ නිලධරයන් අතුරින්, ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 03 ක කාලයක් හෝ දුෂ්කර සේවා ස්ථානයක වසර 02 ක සේවා කාලයක් හෝ සම්පූර්ණ කර ඇති නිලධරයන්

| | |
|---|---|
| – ශිල්ප ප්‍රදර්ශක | – වැද්දුම්කරු |
| – කෘෂි කොන්දොස්තර | – විදුලි කාර්මික |
| – ආයතන සහකාර | – පෙදරේරු |
| – පිළිගැනීමේ නිලධාරි | – වඩුකාර්මික |
| – ගොවිපළ කළමනාකරු | – මුරකරු |
| – රසායනාගාර සහකාර | – රසායනාගාර සහායක |
| – පරිශ්‍ර පාලක | – ක්ෂේත්‍ර සහායක |

2.2 සෑම වසරකම දෙසැම්බර් 31 දින වනවිට, තාක්ෂණ / කාර්මික විද්‍යාලයක නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති සියළුම නිලධරයන් අයදුම් නොකළද වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් වේ.

### 2.3 සේවා ස්ථාන වර්ගීකරණය

පහත පරිදි සේවා ස්ථාන වර්ගීකරණය කරනු ලැබේ.

1. ප්‍රියමනාප සේවා ස්ථාන :- ප්‍රධාන කාර්යාලය, මරදාන තා.වි., ගාල්ල තා.වි., යාපනය තා.වි., කුරුණෑගල තා.වි., කළුතර කා.වි., බලපිටිය කා.වි., වීරවිල කා.වි., බෙලිඅත්ත කා.වි., ඇඹිලිපිටිය කා.වි. මාතර කා.වි., රත්මලාන කා.වි., මඩකලපුව කා.වි.
2. දුෂ්කර සේවා ස්ථාන :- ඉහත ප්‍රියමනාප සේවා ස්ථාන හැර අනෙකුත් තාක්ෂණ / කාර්මික විද්‍යාල

**3. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පහත නිලධරයන්ගෙන් සමන්විත ස්ථාන මාරු මණ්ඩලය පත්කරනු ඇත.

1. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)
2. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධ්‍යන අංශය)
3. එක් එක් තනතුරෙහි වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් නිලධාරී සංඛ්‍යාවෙන් අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක්
4. පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිළධාරියෙකු මුදා හැර ඇති එක් එක් වෘත්තීය සංගමයේ නියෝජිතයෙකු - සමාජික

**4. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර**

**4.1. වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව**

1. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මූල්‍ය)
2. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පරිපාලන)
3. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (අධ්‍යයන කටයුතු )

**4.2. ස්ථාන මාරුවීම්වලට විරුද්ධව කෙරෙන කරුණු දැක්වීම් ඉදිරිපත් කළ හැකි අවස්ථා**

ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන කරුණු දැක්වීම් සලකා බැලීම සඳහා පහත සඳහන් කරුණු පිළිබඳව පරීක්ෂා කර තීරණ ගනු ලැබේ.

4.2.1. මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්

4.2.2 නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු නොවන අවස්ථා

4.2.3 නිලධරයන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම්

**5. වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී සලකා බැලිය යුතු පොදු ප්‍රතිපත්ති**

5.1 ස්ථාන මාරු කිරීමේදී මෙම පටිපාටිය යටතේ නිලධරයන්ගේ ස්ථාන මාරු කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

5.2 වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කාලය ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනටය. ( උදා :- 2018 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2017.12.31 දිනය )

5.3 වාර්ෂික ස්ථානමාරුවීම්වලදී සේවා කාලය ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත් නිලධරයාගේ පාලනයෙන් බැහැරකරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් මාරු මණ්ඩලය ඒ පිළිබඳ සැලකිල්ල යොමු කරනු ලබයි.

5.4 ඉහත 2.1 ජේදය යටතට ගැනෙන නිලධරයකු වෙනත් සේවා ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විටක එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එම සේවා ස්ථානයේ ඉහත 2.2 යටතට ගැනෙන නිලධරයන් අතුරින් නියමිත සේවා කාලය සම්පූර්ණ කළ වැඩිම සේවා කාලයක් ඇති නිලධරයන් ඉන් පිටතට මාරු කළ හැකිය.

5.5 ඉහත 5.4 වගන්තිය යටතේ යම් ආයතනයක නියමිත සේවා කාලයකට වැඩි සේවා කාලයක් සහිත නිලධරයන් වෙනත් අයදුම්කරුවන්ගේ ඉල්ලීම් ඉටු කිරීමට හැකි වන සේ ස්ථාන මාරුවීම්වලට යටත් විය හැකි බැවින්, එවැනි නිලධරයන් මාරුවීමක් ලබාගැනීමට අපේක්ෂා නොකළද තමන් මාරු කරනු ලබන්නේ නම් මාරු වීමට කැමැති ස්ථාන ආකෘති පත්‍ර අංක 01 හි අංක 05 යටතේ සඳහන් කළ යුතුය.

5.6 ප්‍රියමනාප සේවා ස්ථානයක නියමිත සේවා කාලය සම්පූර්ණ නොකරන ලද නිලධරයෙක් දුෂ්කර සේවා ස්ථානයකට ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ නම් අනෙකුත් නිලධරයන්ට අසාධාරණයක් නොවන පරිදි එවැනි ස්ථාන මාරුවක් ලැබීමට සුදුසු වන්නේය.

5.7 සෑම විටම නිලධරයාගේ ඉල්ලීම් අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබාදීමට හැකි සෑම උත්සාහයක්ම දරණු ඇත.

5.8 නිලධරයාට මෙන්ම තම පවුලේ අයටද, ඇතිවන අපහසුතාවයන් අවම කිරීමට හැකි වන සේ ස්ථාන මාරුවක් ලබාදීමට ස්ථාන මාරු කමිටුවට පහසුවීම පිණිස නිලධරයන් විසින් තමා ඉල්ලා සිටින සේවා ස්ථානයට අමතරව තවත් විකල්ප ස්ථාන දෙකක් අනිවාර්යයෙන්ම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

5.9 යම් තාක්ෂණ / කාර්මික විද්‍යාලයන්හි සේවය සඳහා නිලධරයන් තෝර ගැනීමේදී පාසැල් යන දරුවන් ඇති විවාහක නිලධරයන්ට වඩා අවිවාහක නිලධරයන්ද, පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධරයන්ද හැකි සෑම අවස්ථාවකදීම තෝරා ගැනීමට සැලකිලිමත් විය යුතුය.

5.10 ස්ථාන මාරු සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතාවය ලබාදිය යුතු නිලධරයා හඳුනා ගැනීම සඳහා පහත සඳහන් ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ.

| සේවා ස්ථානය | අවුරුද්දක සේවය සඳහා උපරිම ලකුණු | අවම කාලයෙන් ඔබ්බට වූ ප්‍රථම වර්ෂය සඳහා උපරිම ලකුණු | අවම කාලයෙන් ඔබ්බට වූ දෙවන වර්ෂය සඳහා උපරිම ලකුණු | විවාහක / වැන්දඹු තත්ත්වය සඳහා උපරිම ලකුණු | වයස අවුරුදු 18 ට අඩු දරුවන් සඳහා උපරිම ලකුණු | විශේෂ කරුණු උපරිම ලකුණු |
|---|---|---|---|---|---|---|
| ප්‍රියමනාප | 1 | 2 | 3 | 2 | 3 | 4 |
| දුෂ්කර | 4 | 5 | 6 | 2 | 3 | 4 |

5.10.1. සේවා කාලයට මාස ගණනක් ඇතුළත් වන අවස්ථාවන්හි කිට්ටුම සම්පූර්ණ කරන ලද කාර්තුවකට 0.25 ක් ලකුණු දෙනු ලැබේ.

5.10.2. දරුවන් සඳහා ලකුණු ලබාදීමේදී වයස අවුරුදු 18 අඩු එක් දරුවකු සඳහා ලකුණු 01 බැගින් උපරිම ලකුණු 03 කි.

5.10.3. විශේෂ කරුණු යටතේ නිලධාරියා / නිලධාරිණිය හෝ ඔහුගේ / ඇයගේ භාර්යාව / ස්වාමිපුරුෂයා හෝ දරුවන් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් වේ නම් එක් අයෙකු සඳහා ලකුණු 02 බැගින් උපරිම ලකුණු 04 ක් හිමිවේ. ( අදාල තත්ත්වයන් වෛද්‍ය සහතික මගින් සනාථ කළ යුතුය. )

5.11 නිලධරයාගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු නැත්නම් මිස සාමාන්‍ය වශයෙන් වයස අවුරුදු 53 ක් ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතු වුවත්, දිස්ත්‍රික්කය ඇතුළත ස්ථාන මාරු කිරීම් වලට යටත් වන්නේය.

5.12 අයදුම්පත් කැඳවීමට පෙර මාරුවීමට යටත් නිලධරයන්ගේ ලැයිස්තුවක් හා ඇබෑර්තු පවතින කාර්මික විද්‍යාලවල ලැයිස්තුවක් සෑම තාක්ෂණ / කාර්මික විද්‍යාලයකටමහා ස්ථාන මාරු කමිටුවට සහභාගීවීමට සුදුසුකම් ලබන වෘත්තීය සමිතිවලට යැවිය යුතුය.

5.13 ජූලි මාසයේ 01 වන දිනයත්, දෙසැම්බර් මාසයේ 31 වන දිනයත් අතර කාලයයේදී සුහද ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් පත්‍ර භාර නොගත යුතුය.

5.14 ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී ( ආකෘති පත්‍ර අංක 01 පරිදි ) සහ අභියාචනා ඉදිරිපත් කිරීමේදී ( ආකෘති පත්‍ර අංක 03 පරිදි ) සලකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙන ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.

5.15 එක් සේවා ස්ථානයක වසර 03කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන්ගේ වාර්තාවක් මගින් සකස් කර එවීමට ආයතන ප්‍රධානීන් ඉතා වගකීමෙන් යුතුව කටයුතු කළ යුතුවේ.

5.16 සෑම නිලධරයකු පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතුය. සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු ඇති බව හෙළදරව් වුවහොත් අදාළ ආයතන ප්‍රධානින් එම ලැයිස්තු සකස් කළ අය හා එහි නිවැරදි බව පරීක්ෂා කර බලා තහවුරු කරන ලද නිලධරයන් ඒ පිළිබඳ වගකීමට යටත් වේ.

5.17 ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියළුම නිලධරයෝ, නියමිත දිනයේදී නව රාජකාරී ස්ථානය වෙත වාර්තා කිරීමට බැඳී සිටිති. නිලධරයකු වැඩ බාර ගැනීමෙන් පසු ඒ බව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැන්විය යුතුය.

5.18 ස්ථාන මාරුවීම් නියෝග ලැබ සිටින නිලධරයකු එම මාරුවීම් ක්‍රියාත්මක වන දිනයෙන් පසු එම ආයතනයේ සේවයෙන් මුදා නොහැරීම මාරු පටිපාටියට පටහැනිය. අදාල ස්ථාන මාරු නියෝග පරිදි නව සේවා ස්ථානවල සේවය සඳහා අනිවාර්යයෙන්ම වාර්තා කළ යුතුය. ස්ථාන මාරු කමිටුව මගින් ස්ථාන මාරුවීම් ලබාදී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන, නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකි වන සේ මුදා හැරීමට කටයුතු කළ යුතුය. තාක්ෂණ / කාර්මික විද්‍යාලවල අධ්‍යක්ෂ / විදුහල්පතිවරුන් වර්ෂයේ පෙබරවාරි 01 දිනැතිව තම ආයතනයෙන් මුදා හරින ලද / නොලද සේවයට වාර්තා කළ / නොකළ නිලධරයන් පිළිබඳ විස්තර කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැන්විය යුතුය.

## 6. වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළ යුතු කාල සටහන

| | කාර්යය | දිනය |
|---|---|---|
| 1. | වාර්ෂික ස්ථාන මාරු කමිටුව පිහිටු වීම | ජුනි මස 01 වන දිනට පෙර |
| 2. | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම | ජුනි මස 30 වන දිනට පෙර |
| 3. | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාල බලධාරියා වෙත ඉදිරිපත් කිරීම | ජුලි මස 31 වන දිනට පෙර |
| 4. | අදාල බලධරයා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාරදීම | අගෝස්තු මස 15 වන දිනට පෙර |
| 5. | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාල බලධාරියා වෙත ලිඛිතව භාර දීම | අගෝස්තු මස 31 වන දිනට පෙර |
| 6. | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම. | සැප්තැම්බර් මස 15 වන දිනට පෙර |
| 7. | ස්ථාන මාරු වීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචන භාර ගැනීමේ අවසන් දිනය | සැප්තැම්බර් මස 30 වන දිනට පෙර |
| 8. | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාල බලධාරියා වෙත ලිඛිතව භාර දීම | ඔක්තෝම්බර් මස 15 වන දිනට පෙර |
| 9. | අවසාන වාර්ෂික ස්ථාන මාරු වීම් නියෝග නිකුත් කිරීම | නොවැම්බර් මස 01 වන දිනට පෙර |
| 10. | වාර්ෂික ස්ථාන නියෝග මාරු බලාත්මක කිරීම | ජනවාරි මස01 වන දින සිට |

6.1. වාර්ෂික ස්ථාන මාරු චක්‍රයක ආකාරයකින් සිදු කරනු ලබන අතර ඉදිරියේදී කරනු ලබන බඳවා ගැනීම් හෝ උසස්වීම් වලදී අනුප්‍රාප්තිකයන් ලබාදීම මත ස්ථාන මාරු සිදු කරනු නොලැබේ.

## 7. වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳව විස්තර

7.1. ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේනම්, එම අභියාචනය ආකෘති පත්‍ර ඇමුණුම 03 (3a සහ 3b)ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේය. තවද, තමන් විසින් ඉදිරිපත් කරණු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කළ පිටපත් එම අභියාචනය සමග ඉදිරිපත් කිරීමටද ඔහු ක්‍රියා කළ යුතු වන්නේ ය.

7.2. රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් මඟින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාල පරිදි දෙපාර්තමේන්තු ප්‍රධාන හා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත ද යොමු කළ යුතු වන්නේය.

තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදවම තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ (ඇමුණුම 03 හි ඇති ආකෘතිය අනුව) වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

7.3. ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට දින 14ක් ඇතුලත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.4. කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියලු ලිපි ගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශ ද සහිතව එම අභියාචනය ලැබී දින 15ක් ඇතුලත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධාන හා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වග බලා ගත යුතු වන්නේය. එතකුදු වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව අභියාචනා අදාළ ලිපිගොනු, ලිපි ලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමඟ නොවැම්බර් 15 දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

7.5. මෙම පරිච්ඡේදයේ සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචන ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධාරියෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේය.

7.6. ඉහත 7.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකටඑරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

7.7. ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දක්වනු ලබන අතර, එහි පිටපත් අදාළ පරිදිවිෂය භාර අමාත්‍යාංශයේ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධාන වෙත යවනු ලබන්නේය.

7.8. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධාරියෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි

.............................

අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

ඇමුණුම 01

ආකෘති පත්‍ර අංක 01

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරුවල නිලධාරින්**

**සඳහා ස්ථාන මාරු අයදුම්පත**

| තනතුර | | විද්‍යාලය | |
|---|---|---|---|

අ. <u>පෞද්ගලික තොරතුරු</u>

| | | | |
|---|---|---|---|
| 1. සම්පූර්ණ නම :- | | | |
| 2. මුලකුරු සමග නම :- | | | |
| 3. උපන් දිනය :- YYYY/MM/DD | 4. වයස :- (..........12.31 දිනට) අවු.............මාස.......දින........ | 5. ජාතික හැඳුනුම්පත් අංකය:- | 6. ස්ත්‍රී/පුරුෂ භාවය:- |
| 7. ස්ථිර ලිපිනය:- | 8. තාවකාලික ලිපිනය:- | 09. දුරකථන අංකය<br>කාර්යාලය:-<br>පෞද්ගලික:- | |
| 10. විවාහක අවිවාහක බව:- | 11. කලත්‍රයාගේ නම:- | 12. කලත්‍රයාගේ රැකයාව හා සේවා ස්ථානය:- | |
| 13. දරුවන් ගණන:- | 14. ඔවුන්ගේ වයස:- | 15. ඉගෙනුම ලබන පාසල:- | |

ආ. <u>සේවා තොරතුරු</u>

| | |
|---|---|
| 16. වර්තමාන සේවා ස්ථානය:- | 17.වර්තමාන සේවා ස්ථානයට වාර්තාකළ දිනය:- YYYY/MM/DD |
| 18. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය:- (.........12.31 දිනට) අවු.............මාස.......දින........... | 19. ස්ථිර පදිංචි ස්ථානයේ සිට සේවා ස්ථානයට අවම දුර කිලෝ මීටර්:- |
| 20. වර්තමාන සේවා ස්ථානයට පැමිණීමට හේතුව:- (√ ලකුණ යොදන්න )<br>• නව පත්වීමක් ලැබීම මත ☐<br>• වාර්ෂික ස්ථාන මාරු නියෝගය මත ☐<br>• සේවා අවශ්‍යතාවය මත ☐<br>• විනය හේතුවක් මත ☐ | |
| 21. පත්වීම් දිනය:- | |

| | | | සේවා කාලය | |
|---|---|---|---|---|
| | සේවා ස්ථානය | | සිට | දක්වා |
| 22. වර්තමාන තනතුරෙහි සේවා විස්තරය :- | 1. | | | |
| | 2. | | | |
| | 3. | | | |
| | 4. | | | |
| | 5. | | | |
| | 6. | | | |
| | 7. | | | |

ඇ. <u>ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳ තොරතුරු</u>

| |
|---|
| 23. ස්ථාන මාරුව අපේක්ෂා කරන්නේද? නැද්ද යන වග :- |
| 24. අපේක්ෂා කරන්නේනම් එයට හේතු :- |
| 25. අපේක්ෂිත තාක්ෂණ / කාර්මික විද්‍යාල 03 ක් ප්‍රමුඛතාවය අනුව සඳහන් කරන්න |

| | අපේක්ෂා කරන සේවා ස්ථාන |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය බවට සහතික කරමි. අසත්‍ය තොරතුරු ලබාදී ඇති බව සනාථ වුවහොත් විනයානුකූල දඬුවමකට යටත් බවද දනිමි.

දිනය :- ...................................                                                ..............................................

අයදුම්කරුගේ අත්සන

ඉහත සඳහන් තොරතුරු පෞද්ගලික අනුගොනුව අනුව නිවැරදි බව සහතික කරන අතර, මෙම නිලධාරියා අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව/ පසුව ලබාදීමේ පදනම මත ස්ථාන මාරු කිරීම නිර්දේශ කරමි.

දිනය :- ...................................                                                ........................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

ඇමුණුම 02

ආකෘති පත්‍ර අංක 02

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරුවල නිලධාරින් සඳහා ස්ථාන මාරුවීම් - අභියාචනා පිළිබඳ ඉල්ලුම් පත්‍රය**

(සම්පූර්ණ තොරතුරු ඇතුළත් නොකළ අයදුම්පත් අභියාචනා මණ්ඩලය විසින් සලකා බලනු නොලැබේ. )

........................ වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන අභියාචනය

**තාක්ෂණ / කාර්මික විද්‍යාලයේ නම : ........................................................**

**අ. නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුයි.**

| | |
|---|---|
| 1. නිලධාරියාගේ සම්පූර්ණ නම ( පැහැදිලි අකුරින් ) :- | |
| 2. ජාතික හැඳුනුම්පත් අංකය:- | |
| 3. ස්ථිර ලිපිනය:- | |
| 4. පදිංචි ස්ථානයේ ලිපිනය:- | |
| 5. ............ වර්ෂයේ පදිංචි ස්ථානය වෙනස් වන්නේ නම් නව පදිංචි සේවා ස්ථානයේ ලිපිනය:- | |
| 6. ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය:- | |
| 7. තනතුර හා ශ්‍රේණිය:- | |
| • සේවයට ඇතුළත් වූ දිනය: | |
| • වර්තමාන තනතුරට ඇතුළත් වූ දිනය: | |
| 8. උපන් දිනය:- | |

9. සේවා විස්තර:-

| තනතුර | පත්වූ දිනය | සේවා ස්ථානය | සේවා කාලය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

10. අභියාචනය :- (√ ලකුණ යොදන්න )

- ලබා දී ඇති ස්ථාන මාරුව අවලංගු කිරීම ☐
- ලබා දී ඇති ස්ථාන මාරුව සංශෝධනය කිරීම ☐
- ඉල්ලා ඇති ස්ථාන මාරුව ලබා දෙන ලෙසයි ☐

11. අභියාචනා කිරීමට හේතු :- (විස්තරාත්මක නම් ඇමුණුමක් මගින් ඉදිරිපත් කරන්න)

12. ස්ථාන මාරුව සංශෝධනය කළ යුතු / ලබාදිය යුතු සේවා ස්ථානය:-

## ආ. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය.

නිලධාරියා / නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු ඔහුගේ / ඇයගේ පෞද්ගලික අනුගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. ................ වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන අභියාචනය නිර්දේශ කරමි. පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.

- ............................................................................................................................................
- ............................................................................................................................................
- ............................................................................................................................................
- ............................................................................................................................................
- ............................................................................................................................................

දිනය : ..........................  ......................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

ඇමුණුම 03

ආකෘති පත්‍ර අංක 03a

වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා - ආකෘති අංක 01

............වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම-

අභියාචක පිළිබඳ තොරතුරු

අ. **පෞද්ගලික තොරතුරු**

<table>
<tr><td>1. මුලකුරු සමග නම :-</td><td colspan="3"></td></tr>
<tr><td>2. තනතුර හා පන්තිය :-</td><td colspan="3"></td></tr>
<tr><td>3. උපන් දිනය :-<br>YYYY/MM/DD</td><td>4. වයස :- (..........12.31 දිනට)<br>අවු............මාස.......දින........</td><td>5. ජාතික හැඳුනුම්පත් අංකය:-</td><td>6. ස්ත්‍රී/පුරුෂ භාවය:-</td></tr>
<tr><td>7. ස්ථිර ලිපිනය:-</td><td>8. තාවකාලික ලිපිනය:-</td><td colspan="2">09. දුරකථන අංකය<br>කාර්යාලය:-<br>පෞද්ගලික:-</td></tr>
<tr><td>10. විවාහක අවිවාහක බව:-</td><td>11. කලත්‍රයාගේ නම:-</td><td colspan="2">12. කලත්‍රයාගේ රැකයාව හා සේවා ස්ථානය:-</td></tr>
<tr><td>13. දරුවන් ගණන:-</td><td>14. ඔවුන්ගේ වයස:-</td><td colspan="2">15. ඉගෙනුම ලබන පාසැල්:-</td></tr>
</table>

ආ. **සේවා තොරතුරු**

<table>
<tr><td colspan="6">16. තනතුරට පත්වූ දිනය:-</td></tr>
<tr><td colspan="3">17. වර්තමාන සේවා ස්ථානය:-</td><td colspan="3">18. සේවා ස්ථානය පිහිටි නගරය:-</td></tr>
<tr><td colspan="3">19. වර්තමාන සේවා ස්ථානයට වාර්තාකළ දිනය:-<br>YYYY/MM/DD</td><td colspan="3">20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය:- (..........12.31 දිනට)<br>අවු............මාස.......දින...........</td></tr>
<tr><td colspan="6">21. ප්‍රතිලාභ ලබන (ප්‍රයමනාප) සේවා ස්ථානයක / ස්ථානවල සේවය කර තිබේද? :-</td></tr>
<tr><td rowspan="8">22. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන</td><td colspan="2" rowspan="2">සේවා ස්ථානය</td><td rowspan="2">ප්‍රිය මනාප සේවා ස්ථානයකි/ ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයකි</td><td colspan="2">සේවා කාලය</td></tr>
<tr><td>සිට</td><td>දක්වා</td></tr>
<tr><td>1.</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>2.</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>3.</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>4.</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>5.</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>6.</td><td></td><td></td><td></td><td></td></tr>
</table>

**ඇ. ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න)**

| | | | | |
|---|---|---|---|---|
| 23. | වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | ඇත | | ස්ථාන මාරු අයදුම් කර ඇත්නම් අයදුම් කර ඇති සේවා ස්ථාන<br>1.<br>2.<br>3. |
| | | නැත | | |
| ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය | | | | |

24. ස්ථාන මාරු චක්‍රය සමන්විත වන නිලධාරීන් ගණන......................................................................

| | | |
|---|---|---|
| 25. ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
| | නැත | |

26. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම පිළිබඳ තොරතුරු

| | | |
|---|---|---|
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කළ සේවා ස්ථාන<br>01.........................................................<br>02.........................................................<br>03........................................................ |
| සංශෝධනය කිරීම | | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | |

| |
|---|
| 27. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණය |

28. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු

1.................................................................................................................................................
2.................................................................................................................................................
3.................................................................................................................................................

29. ඉහත හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

ඇමුණුම (01)..................................................................................................................................
ඇමුණුම (02)..................................................................................................................................
ඇමුණුම (03)..................................................................................................................................

30. ඉල්ලා සිටිනු ලබන සහන

01. ..................................................................................................................................
02. ..................................................................................................................................
03. ..................................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

.....................................  ................................

දිනය  අත්සන

**ඇ. අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

නිලධාරියා / නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. ................. වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන අභියාචනය නිර්දේශ කරමි. පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.

I. ..............................................................................................................................

II. ..............................................................................................................................

III. ..............................................................................................................................

.........................................            ...........................................

දිනය            අත්සන

**ඉ. ස්ථාන මාරු බලධරයාගේ නිර්දේශය**

I. ස්ථාන මාරු චක්‍රය සම්බන්ධ වන නිලධාරීන් ගණන:..............................................................

II. අභියාචනය පිළිබඳ නිර්දේශය: ........................................................................................

..............................................................................................................................

.........................................            ...........................................

දිනය            අත්සන

............වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම-

අනුප්‍රාප්තිකයා පිළිබඳ තොරතුරු

I. අභියාචක නිලධරයාගේ නම හා තනතුර :……………………………………………………………

II. අභියාචක නිලධරයාට අදාළ අනුප්‍රාප්තික නිලධාරියා පිළිබඳ තොරතුරු

**අ. පෞද්ගලික තොරතුරු**

| | | | |
|---|---|---|---|
| 1. මුලකුරු සමග නම :- | | | |
| 2. තනතුර හා පන්තිය :- | | | |
| 3. උපන් දිනය :- YYYY/MM/DD | 4. වයස :- (..........12.31 දිනට) අවු............මාස.......දින........ | 5. ජාතික හැඳුනුම්පත් අංකය:- | 6. ස්ත්‍රී/පුරුෂ භාවය:- |
| 7. ස්ථිර ලිපිනය:- | 8. තාවකාලික ලිපිනය:- | 09. දුරකථන අංකය<br>කාර්යාලය:-<br>පෞද්ගලික:- | |
| 10. විවාහක අවිවාහක බව:- | 11. කලත්‍රයාගේ නම:- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය:- | |
| 13. දරුවන් ගණන:- | 14. ඔවුන්ගේ වයස:- | 15. ඉගෙනුම ලබන පාසැල්:- | |

**ආ. <u>සේවා තොරතුරු</u>**

| | |
|---|---|
| 16. තනතුරට පත්වූ දිනය:- | |
| 17. වර්තමාන සේවා ස්ථානය:- | 18. සේවා ස්ථානය පිහිටි නගරය:- |
| 19. වර්තමාන සේවා ස්ථානයට වාර්තාකළ දිනය:- YYYY/MM/DD | 20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය:- (..........12.31 දිනට) අවු............මාස.......දින........... |
| 21. ප්‍රතිලාභ ලබන (ප්‍රියමනාප) සේවා ස්ථානයක / ස්ථානවල සේවය කර තිබේද? :- | |

<table>
<tr><td rowspan="8">22. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන</td><td colspan="2" rowspan="2">සේවා ස්ථානය</td><td rowspan="2">ප්‍රිය මනාප සේවා ස්ථානයකි/ ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයකි</td><td colspan="2">සේවා කාලය</td></tr>
<tr><td>සිට</td><td>දක්වා</td></tr>
<tr><td>1.</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>2.</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>3.</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>4.</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>5.</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>6.</td><td></td><td></td><td></td><td></td></tr>
</table>

**ඇ. ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න)**

| | | | | |
|---|---|---|---|---|
| 23. | වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | ඇත | | ස්ථාන මාරු අයදුම් කර ඇත්නම් අයදුම් කර ඇති සේවා ස්ථාන<br>1.<br>2.<br>3. |
| | | නැත | | |
| ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය | | | | |

| | | |
|---|---|---|
| 24. ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
| | නැත | |

25. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම පිළිබඳ තොරතුරු

| | | |
|---|---|---|
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කළ සේවා ස්ථාන<br>01.........................................................<br>02.........................................................<br>03......................................................... |
| සංශෝධනය කිරීම | | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | |

| |
|---|
| 26. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණය |

27. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබේ ද / නැද්ද යන්න

.............................................................................................................................

28. අභියාචකගේ ඉල්ලීම ඉටුකළහොත් අනුප්‍රාප්තික නිලධරයාට අගතියක් නොවන පරිදි ස්ථාන මාරු චක්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ:

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

......................................                                  .................................

දිනය                                  අත්සන